සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2017 (2018)

## (01) මුදල්

පැ තුනයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ප්‍රතිපාදන හා අක්මුදල් අතර වෙනස කුමක් දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 08 යි)*

(ii) ගණන්දීමේ නිලධාරියකු විසින් නිකුත් කරනු ලැබිය හැකි අතුරු අග්‍රිම වර්ග කවරේ දැයි රජයේ මුදල් රෙගුලාසි ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 12 යි)*

**2.** (i) රජයේ මුදල් රෙගුලාසි අංක 154 අනුව විගණකාධිපතිගේ රාජකාරි සහ කාර්යයන් මොනවා දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 10 යි)*

(ii) 'විගණනයේ දී සම්මත කරනු නොලැබූ ගිණුම්' සම්බන්ධව රජයේ මුදල් රෙගුලාසි 117 හි සඳහන් විධිවිධාන මොනවා දැයි විමසන්න. *(ලකුණු 10 යි)*

**3.** රජයේ මුදල් රෙගුලාසි අංක 135 අනුව,

(i) වියදම

සහ

(ii) ආදායම

සම්බන්ධයෙන් බලතල පවරා දිය හැකි එක් එක් කාර්යයන් නම් කර, එම එක් එක් කාර්යයන් පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 20 යි)*

**4.** (i) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියකුගේ වගකීම් මොනවා දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 10 යි)*

(ii) රාජ්‍ය ආදායම පිළිබඳ ගණන්දීමේ නිලධාරියකුගේ යුතුකම් හා වගකීම් මොනවා දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 10 යි)*

**5.** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කමිටුවක සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක වගකීම් හා කාර්යභාරය වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

**6.** (i) 'වීරමොන්' ක්‍රියාපටිපාටිය යනු කුමක් ද? *(ලකුණු 08 යි)*

(ii) 'වීරමොන්' ක්‍රියාපටිපාටිය අනුගමනය නොකළයුතු අවස්ථා මොනවා ද? *(ලකුණු 12 යි)*

**7.** (i) පාඩු හෝ අලාභහානි සම්බන්ධ පරීක්ෂණයකට අදාළ පූර්ණ වාර්තාවක ඇතුළත් වියයුතු කරුණු කවරේ ද? *(ලකුණු 12 යි)*

(ii) මු.රෙ. 108 අනුව, හානි සම්බන්ධව ක්‍රියා කිරීමට බලය දී ඇති නිලධාරීන් සහ ඔවුන්ගේ මූල්‍ය සීමාවන් සඳහන් කරන්න. *(ලකුණු 08 යි)*

**8.** කෙටි සටහන් ලියන්න.

(i) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

(ii) විවෘත චෙක්පත්

(iii) අවිනිශ්චිත අවස්ථා අරමුදල

(iv) රජයේ නිලධාරි අත්තිකාරම් ගිණුම

(v) රාජ්‍ය ආදායම් ගිණුම් *(ලකුණු 04 × 5 = 20 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2017 (2018)

## (03) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය

පැ තුනයි

එක් එක් කොටසින් ප්‍රශ්න තුනක් බැගින් තෝරාගෙන ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

**1.** "අධිකරණයේ ස්වාධීනත්වය යන්නෙන් අදහස් කෙරෙන්නේ මහජනතාව දකින පරිදි එම ආයතනය භුක්ති විඳින විශ්වාසනීයත්වයේ ප්‍රමාණයයි. රටක ප්‍රජාතන්ත්‍රවාදයේ පවතින අඩුව පහසුවෙන් හඳුනා ගැනීමේ ජනප්‍රිය මිනුම් දණ්ඩ වන්නේ මෙම ස්වාධීනත්වයයි."

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවතින අධිකරණයේ ස්වාධීනත්වයට අදාළව ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**2.** "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍ය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය."

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය තුළ ඉහත ප්‍රකාශයේ දැක්වෙන මහජනයා සතු ස්වාධිපත්‍යය ක්‍රියාත්මක වන ආකාරය සාකච්ඡා කරන්න.

**3.** පහත දැක්වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල අඩංගු ප්‍රධාන අංග කෙටියෙන් විස්තර කරන්න.

(i) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ii) ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(iii) දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

**4.** (i) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වගන්තියෙහි දැක්වෙන රාජ්‍ය ප්‍රතිපත්තියේ මෙහෙයවීමේ මූලධර්මවල (Directive principles of states policy) බලපෑම කුමක් දැයි විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තියෙහි දක්වා ඇති මූලික යුතුකම් පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

**5.** පහත සඳහන් ඕනෑම කරුණු දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) රාජ්‍ය සේවා කොමිසන් සභාව

(ii) ඔම්බුඩ්ස්මන්

(iii) අධිකරණ සේවා කොමිසන් සභාව

[ 2 වන පිටුව බලන්න.

## II කොටස

**6.** ජාත්‍යන්තර නීතිය යටතේ මානව හිමිකම් පිළිබඳ සංකල්පය සාකච්ඡා කරන්න.

**7.** ජාත්‍යන්තර නීතියේ මූලික මූලාශ්‍ර මොනවා දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න. වැදගත්කම අනුව එහි යම් ධූරාවලියක් (Hierarchy) තිබේ ද?

**8.** පොදු ජාත්‍යන්තර නීතියේ මූලික හා ප්‍රධාන නීතිමය පුද්ගලයන් ලෙස රාජ්‍යයන් සලකනු ලැබේ. ජාත්‍යන්තර නීතිය යටතේ වඩාත්ම පරිපූර්ණ ආකාරයේ නීතිමය පුද්ගලිකත්වයක් (Legal personality) රාජ්‍යයන් සතු වන බව පැහැදිලි කරන උදාහරණ දෙකක් දක්වා සාකච්ඡා කරන්න.

**9.**

> 2010 මැයි 31 වැනි දින සාසාතීරය වෙත ආධාර ගෙන යන තුර්කි යාත්‍රාවකට ඊශ්‍රායලය කඩා වැදුණි. මේ පිළිබඳව ජාත්‍යන්තර මට්ටමට අනුකූල ක්ෂණික, අපක්ෂපාති, විශ්වාසනීය හා විවෘත විමර්ශනයක් කරන ලෙස එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ හදිසි සැසියක දී නියෝග කෙරිණි. ඊට ප්‍රතික්‍රියා දක්වමින් ඊශ්‍රායලය ප්‍රකාශ කළේ "ඊශ්‍රායලය යනු ප්‍රජාතාන්ත්‍රික ජාතියකි. කිසිදු ජාත්‍යන්තර මණ්ඩලයකින් නොව ඒ පිළිබඳව තමාටම විමර්ශනයක් කිරීමේ හැකියාව හා අයිතිය ඊශ්‍රායලය සතු වේ." යනුවෙනි.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට අවසරයක් තිබේ ද යන්න පැහැදිලි කරන්න.

**10.** පහත සඳහන් ඕනෑම කරුණු දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ගිවිසුමක් අවලංගු කිරීම (Termination of a Treaty)

(ii) ජුස් කෝජන්ස් (Jus Cogens)

(iii) දේශීය ජලතීරය (Territorial Waters)

(iv) දූත මණ්ඩල වරප්‍රසාද හා මුක්තීන් (Diplomatic Privileges and Immunities)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2017 (2018)

## (05) ජාත්‍යන්තර කටයුතු

(පැ තුනයි)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

**1.** "නූතන යුගයේ රටක විදේශ ප්‍රතිපත්තිය එරට ආර්ථික තත්ත්වයන්ට සෘජු බලපෑමක් ඇති කරයි."
සාකච්ඡා කරන්න.

**2.** "තනිව සිටීමේ යුගය අවසන් වී ඇත. නූතන රාජ්‍යයන් ජාත්‍යන්තර ප්‍රජාවේ සාමාජිකයන් සේ කටයුතු කරන අතර ඒ ආකාරයෙන් හැසිරේ."
පහත දැක්වෙන කරුණුවලට අදාළව මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(i) ජාත්‍යන්තර සබඳතාවල නිර්වචනය හා විෂය පථය (Scope)
(ii) ජාත්‍යන්තර සබඳතාවල වෙනස්වන ස්වභාවය

**3.** "අද ලෝකයේ ජාත්‍යන්තර සබඳතා නිර්ණය කරන කරුණු ගණනාවක් ඇත."
උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

**4.** අග්‍රාමාත්‍ය මන් මෝහන් සිං යටතේ හා අග්‍රාමාත්‍ය මෝදිගේ වර්තමාන පාලන කාලය තුළ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉන්දියාව අනුගමනය කළ ප්‍රවේශ සාකච්ඡා කරන්න.

**5.** 'චීන එක් මාවතක් එක් තීරයක් යන ව්‍යාපෘතිය (One Belt and One Road initiative)' ශ්‍රී ලංකාවට අදාළව සාකච්ඡා කරන්න.

**6.** "සරණාගතයන් (Refugees) යනු පීඩාවට පත් මිනිසුන් මිස අර්බුදය (Crisis) නොවේ."
සිරියාවේ පවත්නා තත්ත්වයට විශේෂ අවධානය යොමු කර, මැද පෙරදිග ගැටලුව ඉස්මතු කරමින් මෙය පැහැදිලි කරන්න.

**7.** "ආරක්ෂක මණ්ඩල ප්‍රතිසංස්කරණවල අරමුණ වනුයේ, එක්සත් ජාතීන්ගේ අධිකාරි පත්‍රය (UN Charter) මගින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා ඊට පවරා ඇති වගකීම වඩා හොඳින් ඉටු කිරීමට හැකියාව ලබාදීමය."
ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද? ආරක්ෂක මණ්ඩල ප්‍රතිසංස්කරණවල වර්තමාන තත්ත්වය පෙන්වා දෙමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

**8.** පහත දැක්වෙන කරුණුවලින් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ඉන්දියාව හා පකිස්ථානය අතර සම්බන්ධතාවන්ට අදාළව සාර්ක් (SAARC) සංවිධානය
(ii) BIMSTEC හා රෝහින්ග්‍යා අර්බුදය
(iii) දකුණු චීන මුහුදට අදාළව ආසියාන් (ASEAN) සංවිධානය
(iv) මානව හිමිකම් කවුන්සලය

* * *